## මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

## 2022 අගෝස්තු 23 වන දින

❖ **08 වන සැසි වාරයේ 52 වන සභා වාර්තාව**

**දිනය :- 2022.08.23 වන දින**

**වේලාව :- පෙ.ව.10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. | ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. | ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. | ගරු ප්‍රා.ස.ම. ජේ.එල් ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. | ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 05. | ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. | ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. | ගරු ප්‍රා.ස.ම. මාබෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 08. | ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 09. | ගරු ප්‍රා.ස.ම. කේ.කේ.ජී. සුමේත්‍රා මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 10. | ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 11. | ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 12. | ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 13. | ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 14. | ගරු ප්‍රා.ස.ම. සුගත් සරම්ගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. | ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණි සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 16. | ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නියංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 17. | ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිශ්චන්ද්‍ර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 18. | ගරු ප්‍රා.ස.ම. එන්.ඒ.එස්. විරසිරි මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 19. | ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 20. | ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පද්ම තිලක් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 21. | ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය | පෙ.ව. 10.00 |

22. ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා

පෙ.ව. 10.00

**නොපැමිණීම**

01. ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා
02. ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා
03. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා.
04. ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය.
05. ගරු ප්‍රා.ස.ම. ජී.පී. නිශාන්ත කුමාර මැතිතුමා.
06. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා.
07. ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා
08. ගරු ප්‍රා.ස.ම. ඊ.බී. ඉන්දික මැතිතුමා.

**සහභාගී වූ නිලධාරීන්**

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රන්දුල මයා.
02. කළමනාකරණ සේවා නිලධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණී සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගී වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදී. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ අගෝස්තු මස මහ සභා රැස්වීම සදහා සහභාගී වූ ගරු හිටපු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගී වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මීළගට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**01.පසුගිය සභා රැස්වීම වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 ජුලි මස 21 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියවූ ලෙස සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒ අනුව නිහඬතාවයෙන් පෙනී යන්නේ පසුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි, ඒ අනුව සංශෝදන රහිතව වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජුලි මස 21 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**01. ගරු <u>සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**<u>03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන</u> – නැත**

**<u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>**

**<u>04-01 2022.06.10 මුදල් කමිටු වාර්තාවේ වවුචර් සම්බන්ධව</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

පසුගිය සභාවෙදී 2022.06.10 මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද වවුචර් සම්බන්ධව ගැටළු කිහිපයක් මතු වුණා. ඒ අවස්ථාවේ අසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු ලිඛිතව සපයා තිබෙනවා. එය සියලු දෙනාගේම දැනගැනීම සඳහා කියවා බලන්න පුළුවන්.

**<u>05. යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

**<u>05 – 1. කටුවන සති පොළ භූමියේ සොහොන ආසන්නයේ බිම් අල්ලි ලබා ගැනීම සම්බන්ධව</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන සතිපොළ භූමියේ සොහොන ආසන්න බිම් අල්ලි ලබා ගැනීම සම්බන්ධවයි මැයෙන් ආදායම් පරීක්ෂක විසින් 2022.08.04 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන සතිපොළ භූමියේ බිම් අල්ලි ලබා ගත් වෙළෙන්දෙකුගේ බිම් කොටසෙහි සොහොන් කොතක් පැවතීම හේතුවෙන් එය වෙළඳාම් කටයුතු සඳහා බාධාවක් වන බැවින් භූමිය සඳහා ගෙවන ලද කුලිය නැවත ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත.

නමුත් එම භූමිය සඳහා ගිවිසුම් ගත වී භූමිය බදු දී ඇති බැවින් සහ මෙ පිළිබඳ පූර්ව දැනුවත් කිරීමක්ද සිදුකර ඇති බැවින් එම මුදල් නැවත ගෙවිය නොහැකි බවත් සොහොන හිමි පාර්ශවය

සදහාද වන්දියක් ගෙවීමට නොහැකි අතර අවශ්‍ය ක්‍රමවේදයක් අනුගමනය කර එම සොහොන අදාල ස්ථානයෙන් ඉවත් කර එය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ බිම් කොටස සභාවට පවරලා දීලා තියෙනවා. නමුත් මෙහි පෞද්ගලික පාර්ශවයක් සදහා අයිති සොහොනක් තියෙනවා. ඒ සම්බන්ධව අපි උසාවියේ නඩුවක් ගොනු කරලත් තියෙනවා. කෙසේ නමුත් අපි පොළ පටන් ගත්තට පස්සේ තමයි අදාළ පාර්ශවය මේ සොහොන සදහා අයිතිය ප්‍රකාශ කරන්නේ. අපිට මේ භූමිය නැවත ලබා දීමක් හෝ වන්දි ගෙවීමක් කරන්න බැහැ. මේ ප්‍රශ්නය ඉඩම පවරන අවස්ථාවේ නිරාකරණය කර ගන්න තිබුණා. දැන් අපිට තියෙන්නේ සොහොන ඉවත් කර ගන්නවා නම් ඒ සදහා අවශ්‍ය කටයුතු කරලා දෙන්න. උසාවි කටයුතු අවසන් වුණාම අපි සුදුසු කටයුතු කරමු. මේ බිම කොටස අපි වෙළඳාම් කටයුතු සදහා බදු කුලී මත ලබා දීලා තියෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.බී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මේ සදහා අපි වන්දි ගෙවීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. උසාවි නියෝගය අනුව අපි සොහොන ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමු.

ඒ අනුව කටුවන සතිපොළ භූමියේ පිම අල්ලී ලබා ගත් වෙළෙන්දෙකුගේ බිම කොටසෙහි සොහොන් කොතක් පැවතීම හේතුවෙන් එය වෙළඳාම් කටයුතු සදහා බාධාවක් වන බැවින් භූමිය සදහා ගෙවන ලද කුලීය නැවත ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇතත් එම භූමිය සදහා ගිවිසුම් ගත වී භූමිය බදු දී ඇති බැවින් සහ මේ පිළිබඳ පූර්ව දැනුවත් කිරීමක්ද සිදුකර ඇති බැවින් එම මුදල් නැවත ගෙවිය නොහැකි බවත් සොහොන හිමි පාර්ශවය සදහාද වන්දියක් ගෙවීමට නොහැකි අතර අවශ්‍ය ක්‍රමවේදයක් අනුගමනය කර එම සොහොන අදාල ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 2. දිළිදු පවුලක් සදහා නිවසක සෙවිලි කිරීමට උළු ලබා ගැනීම - කේ.ඩී. අනුෂා ප්‍රියන්ති මිය</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

දිළිදු පවුලක් සදහා නිවසක සෙවිලි කිරීමට උළු කැට ලබා ගැනීම සම්බන්ධව කිරම, බටගස්ස, කෝරටත්ත , 167 ලිපිනයෙහි පදිංචි කේ.ඩී. අනුෂා ප්‍රියන්ති මිය විසින් 2022.08.09 දිනැතිව සිදු කර ඇති ලිපියට අනුව නිවසක සෙවිලි කර ගැනීම සදහා ගොඩනැගිලි වලින් ඉවත් කරන ලද උළු ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම පැරණි කඩ කාමර කඩා ඉවත් කිරීමේදී ඉතිරි වූ උළු 1000ක් පමණ අදාළ පාර්ශවය වෙත ලිඛිතව ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

මේ සම්බන්ධව අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් හරහා යම් දැනුවත් කිරීමක් කරනවා නම් හොඳයි. මේ සම්බන්ධව ග්‍රාම නිළධාරි නිර්දේශයක් ආදිය ලබා ගෙන මේ නිවාස සකස් කරන්න පෙර සූදානම කෙසේද? එම ද්‍රව්‍ය නිසි පරිදි අදාළ කටයුතු සඳහා යොදා ගන්නවාද යන්න පසු විපරමක් කරනවා නම් හොඳයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ පාර්ශවයන් මම පෞද්ගලිකවම දන්නවා. අපි කිරම ගොඩනැගිලි කඩා ඉවත් කරද්දී ඉතිරි වුණ ලී දඬු සහ උළු තියෙනවා. ඒවා තියෙද්දී දිරාපත් වෙනවා. ඒ නිසා අසරණ පවුලකට ශෙයකට සෙවිලි කර ගන්න දෙන එක හොඳයි.

ඒ අනුව කිරම පැරණි කඩ කාමර කඩා ඉවත් කිරීමේදී ඉතිරි වූ උළු 1000ක් පමණ කිරම, බටගස්ස, කෝරටත්ත , 167 ලිපිනයෙහි පදිංචි කේ.ඩී. අනුෂා ප්‍රියන්ති මිය වෙත ලිඛිතව ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>05 – 3. දිළිඳු පවුලක් සඳහා නිවසක් සෙවිලි කිරීමට උළු කැට ලබා ගැනීම - ආර්.ඩබ්. කරුණාවතී මිය</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

දිළිඳු පවුලක් සඳහා නිවසක සෙවිලි කිරීමට උළු කැට ලබා ගැනීම සම්බන්ධව මිද්දෙනිය, වැලිපිටිය, ගල්ගොමඩ ගෙදර ලිපිනයෙහි පදිංචි ආර්.ඩබ්. කරුණාවතී මිය විසින් 2022.08.09 දිනැතිව සිදු කර ඇති ලිපියට අනුව ඇයගේ නිවසක සෙවිලි කර ගැනීම සඳහා ගොඩනැගිලි වලින් ඉවත් කරන ලද උළු ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව කිරම පැරණි කඩ කාමර කඩා ඉවත් කිරීමේදී ඉතිරි වූ උළු 1000ක් පමණ අදාළ පාර්ශවය වෙත ලිඛිතව ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

ඇතැම් පාර්ශවයන්ට මේ ලී දඬු ලබා දීලා අවශ්‍ය කටයුත්ත සිදු කරනවද කියලා බලන්න ඕන. බොහෝ අය රජයෙන් ලබා දෙන එවැනි ආධාර නිසි ලෙස ප්‍රයෝජනයට ගන්නේ නැහැ. ඒ ගැන පසු විපරමක් කරන්න අවශ්‍යයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

වැලිපිටිය ප්‍රදේශයේ පවුලක් සඳහා තමයි මේ උළු ටික දෙන්න තීරණය වුණේ. මොකද රජයේ නිවාස ආධාර මගින් නිවස බැදලා තියෙනවා. වහලය සකස් කර ගන්න බැරිව තමයි ඉන්නේ. ඒ නිසා මේ උළු ටික ඒ අයට දෙමු.

ඒ අනුව වැලිපිටිය, ගල්ගොමඩ ගෙදර ලිපිනයෙහි පදිංචි ආර්.ඩබ්. කරුණාවතී මිය හට කිරම පැරණි කඩ කාමර කඩා ඉවත් කිරීමේදී ඉතිරි වූ උළු 1000ක් පමණ අදාළ පාර්ශවය වෙත ලිඛිතව ලබා

දිම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>05 – 4. PC 065398 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම අළුත් කිරීම සම්බන්ධවයි</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

PC 065398 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම අළුත් කිරීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 19/ යන්ත්‍ර , වාර්ෂික ගිවිසුම් අළුත් කිරීම මැයෙන් 2022.08.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඉල්ලූම් කර ඇති පරිදි PC 065398 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම 2022.08.13 දින සිට 2023.08.12 දින දක්වා කාලය සඳහා ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝ මේෂන් පුද්ගලික සමාගම සමග සේවා ගිවිසුම් අළුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලූම් කර ඇත. ඒ අනුව එකී ආයතනය සමග සේවා ගිවිසුම් අළුත් කිරීම සුදුසු බවත් ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ ගිවිසුම වාර්ෂිකවද අළුත් කරන්නේ. නැත්නම් මේ යන්ත්‍ර වගකීම් කාලය තුළද තියෙන්නේ.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

වගකීම් කාලය අවසන්. මේ යන්ත්‍ර සඳහා ගිවිසුම් ගාස්තු ගෙවන්න ඕන. ඒ අනුව තමයි අළුත් වැඩියාවන් කරන්නේ.

ඒ අනුව PC 065398 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම් 2022.08.13 දින සිට 2023.08.12 දින දක්වා කාලය සඳහා ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝ මේෂන් පුද්ගලික සමාගම සමග සේවා ගිවිසුම් අළුත් කිරීම සම්බන්ධවත් ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>05 – 5. PC 065397 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම අළුත් කිරීම සම්බන්ධවයි</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

PC 065397 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම අළුත් කිරීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 19/ යන්ත්‍ර , වාර්ෂික ගිවිසුම් අළුත් කිරීම මැයෙන් 2022.08.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඉල්ලූම් කර ඇති පරිදි PC 065397 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම 2022.08.13 දින සිට 2023.08.12 දින දක්වා කාලය සඳහා ජෝන් කීල්ස්

ඔටෝ මේෂන් පුද්ගලික සමාගම සමග සේවා ගිවිසුම් අළුත් කිරීම සදහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව එකී ආයතනය සමග සේවා ගිවිසුම් අළුත් කිරීම සදහා සහ ඒ සදහා සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ .ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව PC 065397 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම් 2022.08.13 දින සිට 2023.08.12 දින දක්වා කාලය සදහා ජේන් කීල්ස් ඔටෝ මේෂන් පුද්ගලික සමාගම සමග සේවා ගිවිසුම් අළුත් කිරීම සම්බන්ධවත් ඒ සදහා සභා අරමුදලින් ගෙවීම කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>05 – 6. කටුවන මහජන සති පොළෙහි වතුර රැඳීම වැළැක්වීමට කාණු පද්ධතියක් සකස් කිරීම සදහා සභා අනුමැතිය ලබා ගැනීම</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන මහජන සති පොළෙහි වතුර රැඳීම වැළැක්වීමට කාණු පද්ධතියක් සකස් කිරීම සදහා සභා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 09 හා 2022.08.15 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඒ සදහා සකස් කරන ලද රු. 1795960.14ක ඇස්තමේන්තුව අනුව සභා අරමුදල් මගින් එම කාණු පද්ධතිය සකස් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම.මානෙල් දිසානායක මැතිතුමිය</u>

ගරු සභාපතිතුමණි, කටුවන මාළු පොළෙහි වතුර එකතු වන ස්ථානය සකස් කළාද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒක අපි සකස් කළා. මෙතන නව පොළෙහි පිලී මගින් වැටෙන වතුර ටික බැහැරගෙන යන්න කාණු පද්ධතියක් තමයි සකස් කරන්න තියෙන්නේ. මෙ සදහා ආණ්ඩුකාර තුමන්ගේ අනුමැතියත් ලබා ගන්න වෙයි.

<u>ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

මෙම වියදම් දරන්නේ සභාවෙන්ද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්, සභා අරමුදල් වලින් තමයි මෙම වියදම් දරන්නේ.

ඒ අනුව කටුවන මහජන සති පොළෙහි වතුර රැඳීම වැළැක්වීමට කාණු පද්ධතියක් සකස් කිරීම සදහා සකස් කරන ලද රු.1795960.14ක ඇස්තමේන්තුව අනුව සභා අරමුදල් මගින් එම කාණු පද්ධතිය සකස් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**05 – 7. ලොට් අංක 493 දරණ ඉඩම සම්බන්ධවයි**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ලොට් අංක 493 දරණ ඉඩම සම්බන්ධවයි මැගයන් කාරියමඩිත්ත, කුඩගොඩ- බටහිර , පාලුවත්ත ලිපිනයෙහි පදිංචි වයි. ජී. එන්. ප්‍රියදර්ශන මයා විසින් 2022.08.09 දිනැතිව සිදු කර ඇති ඉල්ලීමට අනුව ඔහු විසින් 1987 වර්ෂයේ සිට ප්‍රාදේශිය ලේකම්තුමා විසින් ලබා දී ඇති කුඩාගොඩ බටහිර ග්‍රාම නිළධාරි වසමේ ලොට් 493 දරණ ඉඩම සඳහා 2016 වර්ෂයේ ඔහු වෙත බලපත්‍රයක්ද අනුමත වුවත් ඒ සඳහා සභාවේ එකගතාවය ලබා දී නැති බැවින් බලපත්‍රය ලබා ගත නොහැකි වී ඇත. ඊට හේතුව ලෙස එවකට පොදු කටයුතු සඳහා ඉඩමක් නොමැති බැවින් මෙය ලබා නොදී ඇති බව සඳහන් කර ඇත. නමුත් ඔහුට මෙහි ගම්මිරිස්, කොස්, පොල් වැනි ස්ථිර වගාවන් සිදු කර ඇති බැවින්ද ජීවත් වීමට මෙම ඉඩම හැර වෙනත් ආදායම් මාර්ගයක් නොමැති බැවින් මෙය ලබා දීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත. මේ සම්බන්ධයෙන් පහත සාමාජිකයින්ගෙන් යුත් කමිටුව මගින් පරික්ෂා කර බලා තීරණයක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

01.ගරු ප්‍රා.ස.ම. ජේ.එල්. ජයන්ත මැතිතුමා

02.ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

03. තාක්ෂණ නිළධාරි ඩබ්. ආර්. කුමාර මහතා

04. ආදායම් පරික්ෂක චම්පිකා චතුරාණි මිය

ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ ඉඩම සම්බන්ධයෙන් සලකා බලද්දි මේ අය දීර්ඝ කාලයක් මේ ඉඩම වල වගා කර ගෙන ජීවත් වෙලා තියනවා නම් කොටසක් හරි ඒ අයට දෙන්න වෙනවා. අපිට ඒ අයව ඉවත් කරන්න බැරි වෙයි. මානුෂිකවත් මේ ගැටළුව දිහා බලන්න වෙනවා.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍ර සේන මැතිතුමා**

මෙවැනි ඉඩම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලූ සැම අවස්ථාවකම අපි එය ලබා දුන්නා. මේ ඉඩම සම්බන්ධව සභාවේ කලින් කථා බහට ලක් වුණාද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ සම්බන්ධව පසුගිය සැසි වාරයේ සභාවේ කතාබහට ලක් වුණා. එවකට කුඩගොඩ - බටහිර වසම ඇතුළු පොදු කටයුතු සඳහා ඉඩමක් නොමැති බැවින් ඒ තීරණය ලබා දෙන්න ඇති. මේ සම්බන්ධව කමිටුවක් මගින් පරීක්ෂා කරලා බලලා සුදුසු තීරණයක් ගන්න.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

කුඩ ගොඩ බටහිර වසමට පොදු කටයුතු සඳහා ඉඩමක් නම් නැහැ. නමුත් අපි මේ සම්බන්ධයෙන් ඉඩම පරීක්ෂා කරලා බලලා තීරණයක් ගනිමු.

**<u>ගරු ප්‍රා.ස.ම. ජේ.එල් . ජයන්ත මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මේ පුද්ගලයා අවුරුදු 30ක් පමණ වගා කටයුතු සිදු කරපු අනවසර ඉඩමක්. නමුත් මේ පුද්ගලයා අක්කර 10 වැඩි ප්‍රමාණයක් කාලයක් තිස්සේ වගා කරලා තියන නිසා මෙක අහිමි වීම අසාධාරණයක්. මේ සම්බන්ධව පරීක්ෂා කරලා මේ සඳහා අනුමැතිය ලබා දුන්නොත් ඒ අයට මේ සඳහා සාධාරණයක් ඉටු කර ගන්න පුළුවන් වෙයි. මීට පෙර මෙවැනි ඉඩම් සඳහා සභා අනුමැතිය ලබා දිලා තියෙනවා. මෙක සභා පාලනයක් නොතිබුණ කාලයේ සභාවට පැමිණි ගැටළුවක්. ඒ සඳහා නිශ්චිත පිළිතුරක් ලබා දිලා නැහැ.

ඒ අනුව කාරියමඩිත්ත, කුඩගොඩ- බටහිර , පාදුවක්ක ලිපිනයෙහි පදිංචි වයි. ඒ. එන්. ප්‍රියදර්ශන මයා විසින් දැනට වගා කර ඇති ඉඩම සම්බන්ධව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව තීරණයක් ලබා දීමට පත් කරන ලද කමිටුව මගින් එය පරීක්ෂා කර බලා තීරණයක් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වාර්තා

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.08.05 වන දින</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

2022.08.05 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 54 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම කිරීම සුදුසු බවත් අංක 01 සහ 06 යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | කුමාර පලිහක්කාර මයා, ,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 7889.00 |
| 2. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 3050.00 |
| 3. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 1818.00 |
| 4. | රොෂාන් ඉන්දුජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 7472.00 |
| 5. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 6. | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආරක්ෂක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 7. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8515.00 |

| | | | |
|---|---|---|---|
| 8. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 9. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 2858.00 |
| 10. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා, මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 9263.00 |
| 11. | සුජ්පා වඩිමෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 9249.00 |
| 12. | කේ.කේ.නාලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8965.00 |
| 13. | ප්‍රියන්ත ඒකනායක මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 6595.00 |
| 14. | ඒ.කේ.ඒ.ක්‍රිශාන්ත මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 7621.00 |
| 15. | ජී.එම්.නිශාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 10816.00 |
| 16. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8832.00 |
| 17. | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 6383.00 |
| 18. | එම්.අමරහේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 3555.00 |
| 19. | බී.ජී.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 20. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුලු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.07.05 සිට 2022.07.12 දක්වා) | 24750.00 |
| 21. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 ජුනි මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 9190.00 |
| 22. | ඩබ්.ජී.දනිකා සුභාෂණී,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2022 ජුනි මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 7050.00 |
| 23. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණ සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 24. | කේ.ජී.අනුර මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5512.00 |
| 25. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3450.00 |
| 26. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කුඩාගොඩ නව පොම්පාගාරයේ විදුලි පරිපථයේ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම ( විදුලිය විසන්ධි වී නැවත පැමිණෙන විට ස්වංක්‍රියව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය පරිපථයක් නිර්මාණය කිරීම) | 24000.00 |
| 27. | රෝහිණී අබේනායක,කැෆේ ෆෙෆ් ශූ,කටුවන පාර,මිද්දෙනිය | 2022.06.21 දින පැවති විගණන කළමනාකරණ කමිටුවට සහභාගී වූ බාහිර ආයතන වල නිලධාරීන් සඳහා සංග්‍රහ ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• ෆ්‍රයිඩ් රයිස් 05-රු2400.00<br>• වතුර බෝතල්05-රු450.00<br>• කෙසෙල් 20-රු800.00<br>• රෝල්ස් 20-රු1400.00<br>• කිරි පැකට් 05-රු400.00 | 5450.00 |
| 28. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ශ්‍රී ලංගම-තංගල්ල ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනීමට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | |

| | | | |
|---|---|---|---|
| | | | 92000.00 |
| 29. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2022 II වන කාර්තුව සඳහා මුද්දර බදු මුදල් ප්‍රේෂණය කිරීම | 11825.00 |
| 30. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | PF-7414 කැබ් රථය සඳහා ඩීසල් 65L මිලදී ගැනීම | 28600.00 |
| 31. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ශ්‍රී ලංගම-තංගල්ල ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනීමට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 88000.00 |
| 32. | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 33. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ශ්‍රී ලංගම-තංගල්ල ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනීමට 2022.07.15 දින ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 92000.00 |
| 34. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 35. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස ගමන් වියදම් ගෙවීම | 11883.00 |
| 36. | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස ගමන් වියදම් ගෙවීම | 7760.00 |
| 37. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම | 1650.00 |
| 38. | ජේ.ඩිලාන් මයා,චන්ද්‍රා ස්ටෝර්ස්,මිද්දෙනිය පාර,කටුවන | 2022 ජූනි මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 9840.00 |
| 39. | අමිල එම්බ්‍රොයිඩර්,පනාමුර පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය නිළධාරී හා අනෙකුත් සාමකරු,කාර්යාල සහයකයින්ගේ නිළ ඇඳුම් ලබා දීම වෙනුවෙන් ගෙවීම කිරීම | 152310.00 |
| 40. | මෙට්‍රො කම්පියුටර් ටෙක්නොලජි,අංක 02,කාලිදාස පාර,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට wife Repeater 01ක් හාToshiba t-2505 toner 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 52700.00 |
| 41. | ඒ.වී.පී.යමුනා නිල්මිණි මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5100.00 |
| 42. | ඩබ්.ඉමේෂා මධුෂානි මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පෙර පාසල් ගුරු පුහුණුව දින 20 ක් ලබාදීම වෙනුවෙන් දීමනා ගෙවීම | 10000.00 |
| 43. | ශන්.ජී.එම්.සාරන්දි.මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පෙර පාසල් ගුරු පුහුණුව දින 19 ක් ලබාදීම වෙනුවෙන් දීමනා ගෙවීම | 9500.00 |
| 44. | ඩබ්.ඒ.දනිතා සුභාෂණී,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2022 ජූලි මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 5310.00 |
| 45. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 ජූලි මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 5600.00 |
| 46. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුලු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.07.20-2022.08.05) | 23425.00 |
| 47. | රත්නායක ටයර් හවුස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු 53-1634 අංක දරන කැබ් රථයට 215/75/15 ප්‍රමාණයේ ටයර් 04 ක් අලුතින් යෙදීම හා ටයර් මාරු කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම | 190800.00 |
| 48. | වීරසිංහ හාඩ්වෙයාර්,අංක 79/A,මහ විදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන මිද්දෙනිය මහජන පොළෙහි විදුලි ආලෝක | |

| | | | |
|---|---|---|---|
| | | පද්ධතිය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 295750.00 |
| 49. | නිව් ඔස්මන් ඉලෙක්ට්‍රිකල්ස්,පළමු පටුමග,විරකැටිය පාර,වලස්මුල්ල | මිද්දෙනිය බිබුල ජල බලාගාරයේ අක්‍රිය වූ ජල මෝටරය එතීම හා අළුත්වැඩියා කර නැවත සවි කිරීම සඳහා මුදල් ගෙවීම | 175000.00 |
| 50. | එල්.ජී.සම්පත්,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව යටතේ පාලනය දෙහිගහහේන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• කාර්යාල මේස 04-රු.55600.00<br>• වාහෙන් කබඩ(6×3) 01 රු 19500.00<br>• Nipponප්ලාස්ටික් පුටු 10-රු 10500.00<br>• වීදුරු කබඩ (6×3) 01-රු19900.00<br>• පොලිතීන් සීලර්(අඟල් 8 Hevi ) 01-රු3500.00<br>• ප්ලාස්ටික් බෝතල් (1 ½kg) 36-රු 5400.00 | 114400.00 |
| 51. | එම්.දිනුෂික් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස ගමන් වියදම් ගෙවීම | 4753.00 |
| 52. | සාමාන්‍යාධිකාරී,බි/ශ විවිධ සේවා සමූපකාර සමිතිය,විරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීමට 2022.07.25 සිට2022.07.29 දක්වා ඉන්ධන බිල ගෙවීම<br>• 252-6508- ඩීසල්-117L<br>• RC-5539-ඩීසල්-40L<br>• RE-8995-ඩීසල්-42L<br>• BAK-9907- පෙට්‍රල්-12L<br>• RC-7796-ඩීසල්-35L<br>• ගබඩාව- ඩීසල් -335L<br>• ZA -2978-ඩීසල්-140 L<br>• 227-5870- ඩීසල්-40L<br>• 53-1634- ඩීසල්-60L<br>• RE-9230-ඩීසල්-38L | 378080.[illegible] |
| 53. | ජී.රශ්මි රවිනා මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි හා ජූලි මස වරිපනම් දත්ත පරිගණකගත කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම | 60800.00 |
| 54. | කේ.ජී.අනුර මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම | 5132.00 |

ඉහත වවුචර් අංක 01 සිට54දක්වා වූ වවුචර් ගෙවීම කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවෙ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරියත් වූ යෝජනා පහත පරිදි වේ.

1) මිද්දෙනිය පුස්තකාලය පිටුපස තාවකාලික කොටසක් ගබඩාවක් ලෙස ඉදි කිරීම සඳහා පහත ද්‍රව්‍ය ලබා ගැනීමට සුදුසු යැයි යෝජනා විය.

- 10 ftRinoAsbastos sheet-10 NUM
- 8ft RinoAsbastos sheet-2NUM
- 6ft RinoAsbastos sheet-1NUM
- 4" cutting wheel-05
- E6013 Weldiry Rod-1 Kg
- Cement-1 Bag (1.29 bag)
- Sand-0.03 Cube
- Metal-0.06 Cube
- Roofing sheet nut-65 nut
- GI Pipe ආයතනය තුළ පවතින කොටස් යොදා ගෙන සැකසීම

2) කටුවන ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන කටුවන සති පොළෙහි එලිමහන් බිම කොන්ක්‍රීට් කර නොමැති බැවින් ද,කඩ කාමර දෙපස බිම වතුර බැස යාමට කාණු පද්ධතියක් නොමැති බැවින් ද,වැහි පීලි ගැලවී ගොස් ඇති බැවින් වර්ෂා කාලවලදී ආදායම් අය කිරීමේදී මෙන්ම,වෙළඳුන් හා පාරිභෝගිකයන් දැඩි අපහසුතාවයට පත්වන බව ආදායම් පරීක්ෂක එම්.කේ.ටී.චතුරිකා මිය විසින් දැනුම් දී ඇත. ඒ අනුව සිදුවන අපහසුතා හේතුවෙන් කඩිනමින් කටුවන සති පොළ භූමියේ අඩුපාඩු සකස් කර දීමට සුදුසු බව යෝජනා විය.

3) ජල ව්‍යාපෘතියේ සිදුවන නඩත්තු කිරීම කටයුතු සඳහා පහත ද්‍රව්‍ය අවශ්‍ය බව සංවර්ධන නිලධාරී,චමින්ද වික්‍රමසිංහ මහතා විසින් දැනුම් දී ඇත.

- අඟල් 4 වටනි වැල් - 02
- අඟල් 6 පුවී වැල් - 02
- අඟල් 4 පුවී වැල් - 02
- 9" බට - 01
- 9" රෙපයාර් සොකට්- 03
- 40mm බට - 15
- රබර් පැකින් සඳහා ¼" ෂීට (2×2)- 02
- හෝස්පවර් අඟල් "25" බිඹුල බලාගාරයට අමතර මෝටරයක්
  ඉහත ද්‍රව්‍ය ලබා ගැනීමට සුදුසු බව යෝජනා විය.

4) කිරම කඩ කාමර ඉදි කිරීමේදී 2022.08.04 දින පැවති සාකච්ඡාවේදී ඇති කර ගත් එකඟතාවයන්ට අනුව එන්.පී.ස්වර්ණා මියගේ කඩ කාමරය,කිරම ඉන්ධන පිරවුම්හල අසල ඉදි කිරීමට යෝජිත කඩ කාමරවලින් එකක් තාක්ෂණික නිලධාරී නියමයන් හා පිරිවිතරයන්ට අනුව එන්වන් ( key money) මුදල්වලින් අඩු කර ගැනීමේ එකඟතාව මත හා අනෙකුත් කඩ කාමර හිමියන් සඳහා කඩ කාමර ඉදි කර දීමට කඩිනමින් ආණ්ඩුකාර අනුමැතිය ලබා ගෙන අදාල ආයතන වෙත ගොස් හෝ එම කාර්ය කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතු බවට නිර්දේශ විය.

5) කටුවන ප්‍රාදේශීය සභාවේ ජල යෝජනා ක්‍රමයේ ධාරිතාවය වැඩි කිරීම සඳහා මිද්දෙනිය උතුර ප්‍රදේශයේ ඉදි කළ නව නළ ළිඳ සඳහා පොම්පාගාරයක් ඉදි කිරීමට අවශ්‍යව ඇති බවත් ඊට තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇස්තමේන්තු සකසා ක්‍රියාත්මක කිරීමට සුදුසු බව යෝජනා විය.

6) මිද්දෙනිය මහජන පොළෙහි විදුලි කැපැදුම් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය පහත ද්‍රව්‍ය ලබා ගැනීමට සුදුසු බව යෝජනා විය.

- Polycrome conduit ¾" - 50 NUM
- Polycrome conduit 1" - 30 NUM
- Bulb wire-20 role
- 15 A wire (7/0.29)-1 role
- One pole 20 A MCB below-05 NUM
- Main switch-01
- Trip switch-01
- Cable clip-50 NUM
- 4 gang switch-01

- 3 gang switch-01
- 2 gang switch-01
- Bulb holder-40 NUM
- Ceiling Rose-40 NUM

ඉහත වවුචර් අංක 01 සිට 54 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව හා ඉහත 01 සිට 06 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි. මෙම මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 48 යටතේ කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මිද්දෙනිය මහජන පොළෙහි විදුලි ආලෝක පද්ධතිය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම ලෙස සඳහන් වෙනවා. අපි කලින් මිලදී ගත්ත විදුලි උපකරණ මේ සඳහා භාවිතා කරන්න බැරිද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒ විදි ලාම්පු සවි කරන්න ගෙනා ද්‍රව්‍ය. මෙහි සඳහන් වෙන්නේ මිද්දෙනිය පොළෙහි විදුලි ආලෝක පද්ධතිය අලුත් වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

දැනට ඒ කටයුතු සිදු කරලා අවසන්ද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

තවම නැහැ. අපි චෙක් පත් ලබා දුන්නම තමයි අපිට භාණ්ඩ ලැබෙන්නේ. දැනට කුමන ද්‍රව්‍ය මිලදී ගන්න ගියත් මුලින් මුදල් ගෙවන්න ඕන. අපිට හදිසි ජල නඩත්තුවක් වගේ අවස්ථාවක කඩිනමින් කරන්න ඕන නිසා ඒ උපකරණ මිලදී ගැනීම ගැටළුවක් වෙන්න පුළුවන්.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

එවැනි අවස්ථාවක කඩිනමින් කමිටුව රැස් කරලා හරි , එහෙම නැත්නම් ඉදිරි සභා අනුමැතියට යටත්ව හරි එම මිලදී ගැනීම කරලා හදිසි නඩත්තු කටයුතු කරන්න. ඒවා පරක්කු කරන්න බැරි නිසා.

ඒ අනුව අංක 01 සිට 54 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සහ 05 දක්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 ජූලි මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 වර්ෂයේ ජූලි මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.443450.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 49984.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.393306.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

දැනට පිස්සු බැද්ද පොළ පවත්වන්නේ නැද්ද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

පිස්සුබැද්ද පොළෙහි වෙළඳුන් කිහිප දෙනෙක් ඉන්නවා. නමුත් නිලධාරියෙක් යවලා බදු එකතු කිරීම පාඩු නිසා යවන්නේ නැහැ.

ඒ අනුව 2022 ජූලි මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 ජූලි මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 ජූලි මස වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:92000.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,රියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 357113.00 ක වියදමක් දරා ඇත. ඒ අනුව යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් රු: 365113.00 අලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජූලි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 ජූලි</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා ජූලි මස රු.580380.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

දැනට ඉන්ධන ඩිපෝවෙන් ලබා ගන්නවද? නැත්නම් මෙහේ පිරවුම්හල් වලින් ගන්නවද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

දැන් ආයෙත් මෙහෙන් තෙල් ගන්නවා. නමුත් ලැබෙන ප්‍රමාණය මදි . ඒ නිසා ආයෙත් ඩිපෝවෙන් ගන්න පුළුවන්ද කියලා බලන්න වෙනවා. දැන් අපිට නැවත වතුර බෙදන්න වෙලා තියෙනවා. එහිදී ඉන්ධන අවශ්‍ය වෙනවා.

ඒ අනුව 2022 ජූලි මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොමැති බැවින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

## <u>06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 මැයි මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 මැයි මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 1232222.68 ක් වන අතර මාසික වියදම රු.2657105.80 වේ. ඒ අනුව මාසික අලාභය රු: 1424883.12 කි. ඒ අනුව මැයි මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපිට මේ වතුර ප්‍රශ්නය ලොකුවට බලපාන්නේ මිද්දෙනිය උතුර ජල පොම්පාගාරයේ ගිනි ගැනීමත් එක්ක එතනින් ජල සැපයුම ගන්න බැරි වීම නිසා . ඉදිරියේදී ජල ගාස්තු පවා වැඩි කරන්න වෙයි. මොකද විදුලි බිල වැඩි වීමත් සමග ඊට සාපේක්ෂව ජල බිලත් වැඩිවෙයි.

ඒ අනුව 2022 මැයි මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම - 2022 මැයි මස**

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

කටුවන ප්‍රාදේශීය සභාට සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 මැයි මස වන විට ආරම්භක හිඟය රු: 8853877.97ක් වන අතර මැයි මස අවසාන හිඟය රු: 7607866.97 ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 1246011.00කි. මෙම වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 මැයි මස මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 14, 16 ,07 වාර්තා**

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 07,16,14 ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 ජූනි මස ප්‍රා.ස. 14,16, 07 වාර්තා

ගරු ප්‍රා.ස.ම. සුගත් සරම්ගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 ජූලි මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16,14,07 වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08. වෙනත් යෝජනා**

**08-1. වැඩ ක්ෂේත්‍ර කම්කරු ( අනියම්/ ආදේශක) තනතුරු 04ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

වැඩ ක්ෂේත්‍ර කම්කරු ( අනියම්/ ආදේශක) තනතුරු 04ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 02 හා 2022.08.17 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතියේ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම සඳහා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 04ක් ආදේශක හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා සකස් කරන ලද සාධාරණීකරණ වාර්තාව අනුව මෙම බඳවා ගැනීම සිදුකිරීම සම්බන්ධව අනුමැතිය ලබා දීම සුදුසු බවත් ඒ අනුව මෙය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජ්. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපේ වැඩ ක්ෂේත්‍ර කම්කරු අය දෙදෙනෙක් පසුගිය දිනවල විශ්‍රාම ගියා. දැනට ජල බිල් බෙදන අමරසේන මහතා සහ තවත් සේවකයින් දෙදෙනෙක් පමණ ඉදිරියේදි විශ්‍රාම යාමට නියමිතයි. ඒත් එක්කම ඕ.ඩී. චමිල් මහතා අසනීප තත්වයේ ඉන්නේ. ඒ නිසා අපිට තව කිහිප දෙනෙක් සේවය සඳහා බඳවා ගන්න අවශ්‍ය සාධාරණීකරණ වාර්තාව සකස් කරලා පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ අනුමැතියට යවමු. අනුමැතිය ලැබුණොත් අපිට ඒ අය බඳවා ගන්න පුළුවන්.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතියේ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම සඳහා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 04ක් ආදේශක හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා සකස් කරන ලද සාධාරණීකරණ වාර්තාව අනුව මෙම බඳවා ගැනීම සිදුකිරීමට අනුමැතිය ලබා දීම සම්බන්ධවත් ඒ අනුව මෙය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කිරීම සම්බන්ධවත් විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-2. පොහොර උර මිලදී ගැනීම සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

පොහොර උර මිලදී ගැනීම මැයෙන් අංක කප්‍රාස 30 හා 2022.08.17 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙහි නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර පාර්සල් කිරීම සඳහා අවශ්‍ය කරන පොහොර උර සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ජ්. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපේ කොම්පෝස්ට් අලෙවි වීම සිදුවෙනවා. අපිට දැනට පොහොර පාර්සල් සකස් කරන්න පොලිතින් මහාමැති නිසා පොහොර උර මිලදී ගැනීම සිදු කරමු.

ඒ අනුව ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙහි නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර පාර්සල් කිරීම සඳහා අවශ්‍ය කරන පොහොර උර සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-3 .මිද්දෙනිය ආදළුගොඩ මාර්ගය සම්බන්ධව

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ජ්කනායක මැතිතුමා.**

මිද්දෙනිය , කටුවන පාරෙහි ආඳුළගොඩ මාර්ගයේ ස්වාභාවිකව ජලය බැසයන කානුව අවහිර කිරීම හේතුවෙන් මිද්දෙනිය දෙසින් මාර්ගයට ඇතුළුවීමෙදීම අක්‍රමවත් ගොඩ කිරීම හේතුවෙන් මාර්ගයේ කාණු පද්ධතිය ඇහිරී මාර්ගය මතින් ජලය ගලායාම නිසා මාර්ගය විනාශ වී ඇති බවට මා වෙත ලැබූ ලිපියකට අනුව එම මාර්ගය පරීක්ෂා කරන ලදී .එහිදී එම කටයුත්ත මිද්දෙනිය පොලීසියේ උප පොලිස් පරීක්ෂක වරයෙකු වන දයාරත්න යන අය විසින් සිදු කර ඇතැයි ගම් වාසීන් විසින් ප්‍රකාශ කළ අතර කෙසේ නමුත් මේ පිළිබඳ අදාළ නිලධාරීන් යොදවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර මෙම මාර්ගයේ ගමන් කරනු ලබන ජනතාවට සාධාරණයක් ඉටු කර දෙන්නයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ධනි.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

මීට පෙර අපි මාර්ගය අවහිර වුණ අවස්ථා වල අනෙක් බලපෑම් පිළිබද නොතකා අපේ කාක්ෂණ නිලධාරීන් මෙම ස්ථානය පරීක්ෂා කරලා අපේ යන්ත්‍ර සූත්‍ර යොදවලා මාර්ගය සකස් කිරීම කළා. නැවතත් ඒ තත්වයට පත් වෙලාද දන්නේ නැහැ. නමුත් අපේ තාක්ෂණ නිලධාරීන්ට මේ පිළිබද පරීක්ෂා කරලා බලන්න කියන්නම් , ඒ අවස්ථාවට ඔබතුමන්ට සම්බන්ධ කර ගන්නම්.

ඒ අනුව මිද්දෙනිය ආඳුළු ගොඩ මාර්ගයේ ස්වාභාවිකව ජලය බැසයාම අවහිර කර, පස් දමා ගොඩ කර නිවසක් ඉදිකර අවට භූමියද පස් වලින් පුරවා ස්වාභාවිකව ජලය බැසයාම වැළැක්වීම සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිල්ල පිළිබද තාක්ෂණ නිලධාරී මගින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඒ සදහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08- 4 . ජල උපකරණ ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ජල උපකරණ ලබා ගැනීම මැයෙන් ගබඩා භාරකරු විසින් 2022.08.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ ජල ගබඩාව සදහා අවශ්‍ය පහත උපකරණ සැපයුම් ආයතන මගින් මිල කැදවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

01.1/2" එල්බෝ - 600

02. 1/2" ෆෝසෙට් සොකට් - 500

03. 1/2" වැල් සොකට් - 400

04. 1/2" ටී සොකට් - 100

05.1 1/2" එල්බෝ - 20

06. 1 1/2" බෙන්ඩ් - 20

07. 2" * 11/2" R Socket - 20

08.1 1/2" PVC බට - 50

09. ගම් බෝතල් ( 500g) - 20

10. 1 ¼" PVC බට - 20

11.1/2" Stop valve - 100

12.2" සැඩල් - 50

13. 3" සැඩල් - 50

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී, අපි ඉක්මණින් මේ උපකරණ මිලදී ගනිමු.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාවේ ජල ගබඩාව සඳහා අවශ්‍ය උපකරණ සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සහා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

**<u>08-5. ගංවතුරින් හානියට පත් හදුගල තරුණ සේවා මාර්ගය පිළිසකර කර ගැනීම</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ගංවතුරින් හානියට පත් හදුගල තරුණ සේවා මාර්ගය පිළිසකර කර ගැනීම සම්බන්ධවයි මැයෙන් වලස්මුල්ල ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය මගින් එවා ඇති අංක DSWA/SOD/1/SSDIS/F1/02 හා 2022.08.10 දිනැති ලිපියට අනුව හදුගල ග්‍රාම නිළධාරි වසම හරහා ඉදිකර ඇති තරුණ සේවා මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එය පිළිසකර කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ සඳහා තාක්ෂණික සේවා නිළධාරි වාර්තාවක් මත සභාවේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් එම පිළිසකර කිරීම සිදු කිරීම සුදුසු බවත් ඒ සඳහා යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය ඉන්ධන වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් තුමා සමග සාකච්ඡා කර ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ටී.ශාන්ත මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපිට ඉන්ධන ගැටළුව තමයි තියෙන්නේ. ප්‍රාදේශිය ලේකම් තුමා සමග සාකච්ඡා කරලා ඉන්ධන සපයා ගන්නා ආකාරය සම්බන්ධීකරණය සිදු කර ගන්න පුළුවන් නම් මේ කටයුත්ත ඉක්මණින් කරන්න පුළුවන්.

ඒ අනුව හදුගල ග්‍රාම නිළධාරි වසම හරහා ඉදිකර ඇති තරුණ සේවා මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එය පිළිසකර කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ සඳහා තාක්ෂණික සේවා නිළධාරි වාර්තාවක් මත සභාවේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් එම පිළිසකර කිරීම සිදු කිරීම සම්බන්ධවත් ඒ සඳහා යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය ඉන්ධන වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් තුමා සමග සාකච්ඡා කර ලබා ගැනීම සම්බන්ධවත් විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

**<u>08-06. වැලිපිටිය ( ප්‍රයිම් ලැන්ඩ් ) ජල බලාගාරය ඉදිකිරීම</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

වැලිපිටිය ( ප්‍රයිම ලැන්ඩ) ජල බලාගාරය ඉදිකිරීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.08.20 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මිද්දෙනිය පානිය ජල ව්‍යාපෘතියේ පවත්නා ජල හිගය හා ඉදිරි ජල අවශ්‍යතා වලට සරිලන පරිදි නල පද්ධතියට ජලය සැපයුම් ස්ථානයක් සකස් කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව වැලිපිටිය ප්‍රයිම් ලැන්ඩ් ඉඩමෙහි කැණීම කර ඇති නල ළිඳ සහ සභාව සතුව ඇති මෝටරය භාවිතා කරමින් තව දුරටත් එම ජල බලාගාරය ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය තාක්ෂන නිළධාරි වාර්තාවක් මත සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බවත් විදුලිය ලබා ගැනීම සඳහා විදුලි බල මණ්ඩලය මගින් ලබා දෙන ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් ගෙවා විදුලිය ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී අයි.කේ.සුසන්ත පද්මතිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මෙම ඉඩමේ දැනට නළ ළිඳක් ඉදි කරලා තියෙනවා. ඒත් එක්කම ජල ටැංකියක් තියෙනවා. දැනට අවශ්‍ය වන බට ටිකත් අරගෙන තියෙනවා. ඉතිරි අවශ්‍ය ද්‍රව්‍ය හා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය වියදම් සහා අරමුදලින් වියදම් කරලා අපි මේ මෙම ඉඩමේ ජල බලාගාරයක් ඉදි කරමු. අපිට අඹගස්ආර, වැලිපිටිය ප්‍රදේශ වලට ජලය සපයන්න එමගින් පුළුවන්.

ඒ අනුව වැලිපිටිය පුයිම ලෑන්ඩ් ඉඩමෙහි කැණීම් කර ඇති නළ ළිඳ සහ සභාව සතුව ඇති මෝටරය භාවිතා කරමින් කව දුරටත් එම ජල බලාගාරය ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය තාක්ෂණ නිලධාරි වාර්තාවක් මත සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධවත් ඒ සඳහා විදුලි බල මණ්ඩලය මගින් ලබා දෙන ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් ගෙවා විදුලිය ලබා ගැනීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-07. 2022 වර්ෂය සඳහා කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයෙන් පොත් මිලදී ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

2022 වර්ෂය සඳහා කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයෙන් පොත් මිලදී ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි මැයෙන් අංක තප්‍රාස 31 හා 2022.08.19 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ජාතික කියවීම් මාසය පෙර දැරි කර ගෙන කොළඹ ජාතික පොත් ප්‍රදර්ශනය 2022 සැප්තැම්බර් මස 16 සිට 25 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පවත්වනු ලබන බැවින් ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සහ විද්‍යුත් පුස්තකාල සඳහා අවශ්‍ය කෘති හා උපකරණ ඒ සඳහා අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ඒ. ගාමිණී මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

මේ සඳහා අපි අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. ඒ පොත් ප්‍රදර්ශනයේ ඇති කෘති සම්බන්ධ ලේඛනයක් ගෙන්වා ගෙන පුස්තකාල වල සිටින අය විසින් අවශ්‍ය කෘති තෝරා ගෙන ගියාම මෙම කාර්යය පහසු වෙනවා.

ඒ අනුව ජාතික කියවීම් මාසය පෙර දැරි කර ගෙන කොළඹ ජාතික පොත් ප්‍රදර්ශනය 2022 සැප්තැම්බර් මස 16 සිට 25 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පවත්වනු ලබන බැවින් ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල සහ විද්‍යුත් පුස්තකාල සඳහා අවශ්‍ය කෘති හා උපකරණ ඒ සඳහා අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-8. වවුචර් සඳහා ගෙවීම් කිරීම

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 590 - විගණකාධිපති, අංක 306/72, පොල්දූව පාර ,බත්තරමුල්ල- 2021.01.01 සිට 2021.12.31 දක්වා වූ කාලයට අදාළව කටුවන ප්‍රාදේශීය සභාවේ සිදු කරන ලද විගණනය සඳහා වූ විගණන ගාස්තු ගෙවීම. - රු.139800.00

02. වවුචර් අංක 163 - සෝමසිරි ස්ටෝර්ස් පුයිවට් ලිමිටඩ්, රත්න පාර, අකුණුකොළ පැලැස්ස -කටුවන ආදාහනාගාරයේ ආදාහන කටයුතු සඳහා පිරවූ ගෑස් සිලින්ඩර් 05ක් සඳහා ගෙවීම රු.96750.00

03. වවුචර් අංක 170 - I. A L ලියනාරච්චි, ලෑප්මෙන් ඉංජිනියරින්, නො 58 B, රජමහලේ, ලාරපොළ- කටුවන ආදාහනාගාරයේ සිදුකරන ලද හදිසි නඩත්තු කටයුතු සඳහා ගෙවීම - රු. 82000.00

04. වවුචර් අංක 591- ශාන්ති ටයර් මාට් ( පුද්) සමාගම, අංක 120, මහ වීදිය, දික්වැල්ල - 252-6568 අංක දරණ කැබ් රථයට 235-70-16 ප්‍රමාණයේ ටයර් 4ක් අලුතින් යෙදීම- රු. 203600.00

05. වවුචර් අංක 609 - සී.ස.වී.සේ.සමුපකාර සමිතිය , වීරකැටිය- කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීම සඳහා 2022.08.01. සිට 2020.08.17 දක්වා කාලය තුළ ඉන්ධන සඳහා ගෙවීම් කිරීම — රු. 475550.00

06. වවුචර් අංක 595- පෝස්ට් මාස්ටර් ජනරාල් , තැපැල් කාර්යාලය, මිද්දෙනිය. - කාර්යාලයේ ඉදිරි ලිපි තැපැල් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 30000.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා</u>

අපි මෙම වවුචර් සඳහා ගෙවීම් කරමු.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් කඩිනමින් ගෙවීම කළ යුතු බැවින් එම වවුචර් පරීක්ෂා කර බලා ගෙවීම කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-09. දෙස් විදෙස් සංචාරකයන්ට පහසුකම් ඇති කිරීමේ ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධවයි</u>**

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

දෙස් විදෙස් සංචාරකයන්ට පහසුකම් ඇති කිරීමේ ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධවයි මැයෙන් කටුවන, කෙසෙල්වත්ත, ගගගාඩ ලිපිනයෙහි පදිංචි කේ.කේ.රාමචන්ද්‍ර යන අය විසින් 2022.08.22 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඌරුබොක්ක ඔය ආශ්‍රිතව නිර්මාණය වී ඇති ඇල්ලෙවල නැමති කුඩා දියඇල්ල හා අවට කඳු හෙල් පද්ධතිය ආශ්‍රිත කර ගෙන සංචාරකයින්ට පහසුකම ඇති ස්ථාන සකස් කිරීමට අවසර ඉල්ලා ඇත. මේ පිළිබඳ සංචාරක අමාත්‍යාංශය හෝ මෙම සම්බන්ධව කටයුතු කරන ආයතනයක් මගින් අවසර ඉල්ලා යැවීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී සිරිසේන හෙට්ටිගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ සම්බන්ධව අපිට අවසර දීමේ හැකියාවක් නැහැ. ඒ නිසා සංචාරක අමාත්‍යාංශය හෝ මෙම සම්බන්ධව කටයුතු කරන ආයතනයක් වෙත යොමු කරන්න කියමු.

ඒ අනුව ඌරුබොක්ක ඔය ආශ්‍රිතව නිර්මාණය වී ඇති ඇල්ලෙවල නැමති කුඩා දියඇල්ල හා අවට කඳු හෙල් පද්ධතිය ආශ්‍රිත කර ගෙන සංචාරකයින්ට පහසුකම් ඇති ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශය මගින් අවසර ඉල්ලීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-10. මිද්දෙනිය උතුර නව ජල පොම්පාගාරය ඉදිකිරීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මිද්දෙනිය උතුර නව ජල පොම්පාගාරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව සකස් කරන ලද රු.317789.41ක ඇස්තමේන්තුව අනුව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත එම කර්මාන්තය සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

01. කර්මාන්තයේ නම - මිද්දෙණිය උතුර නව ජල පොම්පාගාරයක් ඉදිකිරීම

02. කර්මාන්තය ඉටු කිරීමට ඇති බලය - මහා සභා තීරණ

03. කටුවන ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන මිද්දෙණිය ජල යෝජනා ක්‍රමය පවුල් ඒකක හාරදහසකට ආසන්න ප්‍රමාණයක් සඳහා මාසිකව ඝන ලීටර් මිළියන 15කට ආසන්න ප්‍රමාණයක ජල සැපයුමක් නිකුත් කරනු ලබන ව්‍යාපෘතියකි.මෙහි ක්‍රියාත්මක පොම්පාගාර 11 අතුරින් එකක් වන මිද්දෙනිය උතුර ජල පොම්පාගාරය සඳහා ජල මෝටර් දෙකක් ස්ථාපිත කර ඇති අතර විදුලි ධාරිතාවය සමබර නොවීම මත එම මෝටර් දෙකම එකවර ක්‍රියාකල නොහැකිව පවතී.මෙම මෝටර් දෙක ප්‍රදේශ දෙකක ජල සැපයුම ආවර්ණය කරනු ලබන අතර ගම් වනාවිට විදුලි සැපයුමේ ගැටළුව හේතුවෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ එක් මෝටරයක් පමනක් වන අතර, එය ප්‍රධාන ජල සැපයුමට දැඩි බලපෑමක් එල්ලකර ඇත. විදුලි සැපයුම් දෙකක් ලබා ගැනීම සඳහා ගොඩනැගිලි දෙකක් අවශ්‍ය වන අතර දැනට එම ස්ථානයේ පවතිනුයේ එක් ගොඩනැලිල්ලක් පමනි. එබැවින් අමතර විදුලි සැපයුමක් ලබාගැනීමේ අවශ්‍යතාවය මත නව ආවරණ ගෘහයක් (කුඩා කාමරයක්) කඩිනමින් ඉදිකල යුතුව ඇත.

04. දැනටමත් මිද්දෙණිය ජල යෝජනා ක්‍රමයේ ජල සැපයුම ප්‍රමානවත් පරිදි සිදු නොවීම මත ජල සැපයුම අඩාල වීම හේතුවෙන් පවුල් ඒකක 1300 කට ආසන්න ප්‍රමාණයක් පීඩාවට පත්ව ඇත. එම පවුල් ඒකක වෙත ජල බවුසර මගින් ජලය බෙදා හැරීමේ කටයුතු ද පවත්නා ඉන්ධන අර්බුධය හේතුවෙන් සිදුකල නොහැකිව ඇත.ජල සැපයුම නොලැබීම මත සභාව හා ජලය පරිභෝජනය කරනු ලබන මහජනතාව අතර විශ්වාසය පළුදු වෙමින් පවතින අතර එය කඩිනමින් සමනයකට පත්කර ගත යුතුව ඇත.

05. ඇස්තමේන්තු මුදල - රු. 317789.41

06. මෙම කර්මාන්තය නිසා ලබන සමාජ/මූල්‍ය ප්‍රතිලාභ -

- ❖ මිද්දෙණිය ජල ව්‍යාපෘතියේ ජල සැපයුම් ධාරිතාවය යථා තත්වයට පත් කිරීම තුලින් පීඩාවට පත්වී ඇති පවුල් ඒකක 1300 කට ආසන්න මහජනතාව වෙත දෛනික අවශ්‍යතාවය සඳහා යථා පරිදි ජල සැපයුම ලබාදිය හැකි වීම.

- ❖ ජල ව්‍යාපෘතියේ ජල ධාරිතාවය වැඩිවීම තුලින් දැනට පවතින අවපීඩන මට්ටම පාලනය කරගත හැකි වීමත්,එමගින් උස් ප්‍රදේශයන්හි ජල සැපයුමට සිදුවන බාධාවන් මගහැරී යයි.

- ❖ ජල මෝටර් පූර්ණ උපයෝජනයට ලක්කල හැකි වීම.

- ❖ මෝටර් වල විවේක කාල සීමාව වැඩිකිරීම තුලින් එහි ආයු කාලය වැඩිකරගත හැකි වීම.(දැනට පැය 24 පුරා ක්‍රියාත්මකව මෝටර් පවතින අතර විවේක කාල සීමාව පැය 03 ක කාලයක් පමනි.)

- ❖ ජල බවුසර මගින් ජලය බෙදාහැරීමේදී සිදුවන ඉන්ධන හා ශ්‍රම පිරිවැය අවම කරගත හැකි වීම.

- නව ජල සබඳතා ලබාදිය හැකි වීම තුලින් ආදායම් මට්ටම වැඩිකරගත හැකි වීම.

- ජල පාරිභෝගිකයින් හට දෛනිකව පිරිසිදු කරන ලද ජල සැපයුම ලබා දිය හැකිවීම තුලින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වල වර්ධනයක් ඇති වීම.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

__ගරු ප්‍රා.ස.ම.ඩබ්.බී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා.__

ගරු සභාපතිතුමණි, දැනට අපිට ජලය බවුසර් මගින් බෙදා හැරීම කරන්නෙ කුඩාගොඩ ජල ටැංකි වල ජලය තමයි. නමුත් එතනත් එම ජලයත් අඩු පැහැ වීමක් තියෙනවා. ඒ නිසා මේ ජල පොම්පාගාර සඳහා බවුසර් සඳහා ජලය සැපයිය හැකි ස්ථානයක් සහිතව ඉදිකිරීම කරන්න කියලා මම යෝජනා කරනවා. අනෙක් කාරණය තමයි මිද්දෙණිය උතුර නල ළිඳෙහි ජලය හොඳයි. ඒ නිසා එම ස්ථානයෙහි මෙය සකස් කිරීම වඩාත් හොඳයි.

__ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා__

අපි වැලිපිටිය හෝ මෙම ස්ථානයේ ජල පොම්පාගාර සඳහා බවුසර් සඳහා ජලය සැපයිය හැකි ස්ථානයක් සහිතව සකස් කරමු.

ඒ අනුව මිද්දෙණිය උතුර ජල පොම්පාගාරය ඉදි කිරීම සඳහා සකස් කර ඇති රු. 317789.41 ක ඇස්තමේන්තුව අනුව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගෙන සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## __08-11.වාහන අපහරණය කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් සහ අපහරණය කරන වාහන තක්සේරු කිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීම__

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

වාහන අපහරණය කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් සහ අපහරණය කරන වාහන තක්සේරු කිරීම සඳහා මණ්ඩලයක් පත් කිරීම මැයෙන් කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2022.08.22 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 අනුව කටුවන ප්‍රාදේශීය සභාව සතු අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක්ද වාහන තක්සේරු කිරීම සඳහා මණ්ඩලයක්ද පත් කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව එම මණ්ඩල පහත සංයුතියෙන් යුතුව පත් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

__වාහන හඳුනා ගැනීමේ විශේෂ සමීක්ෂණ මණ්ඩලය සඳහා__

01.සභාපති - ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු

02.යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකු හෝ කාර්මික නිලධාරියෙකු

03.ආයතනයේ වත්කම් සම්බන්ධ වගකීම දරණ මාණ්ඩලික නිලධාරියෙකු

__වාහන තක්සේරු මණ්ඩලය සඳහා__

01.සභාපති - ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු (දිව ව්‍යාප්ත සේවයක පළමු පන්තියේ නිලධාරියෙකු)

02.මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකු

03. යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකු හෝ තාක්ෂනික නිලධාරියෙකු

04.අවශ්‍යතාවය අනුව ආයතන ප්‍රධානී විසින් පත් කරනු ලබන වෙනත් නිළධාරීන් - දෙදෙනෙකු

ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරඹගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

මෙ සංයුතියෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කරලා වාහන අපහරණය කරන කටයුත්ත කරමු.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව සතු අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක්ද වාහන තක්සේරු කිරීම සඳහා මණ්ඩලයක්ද අදාල සංයුතියෙන් යුතුව පත් කර එම කටයුතු සිදු කිරීම සම්බන්ධව විවෘතිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## __08-12.කිරම බස් නැවතුම් පොළට යාබදව වරාපිටිය මාර්ගය අසළ කඩ කාමර 02ක් ඉදි කිරිම__

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

කිරම බස් නැවතුම් පොළට යාබදව වරාපිටිය පාර අසල අළුතින් කඩ කාමර 02ක් ඉදිකිරිම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 07 විසින් 2022.08.22 දිනැතිව ලබා දුන් ලිපියට අනුව කිරම බස් නැවතුම් පොළට යාබදව වරාපිටිය පාර අසළ අළුතින් කඩ කාමර 02ක් ඉදිකිරීමටත් , ඉන්ධන පිරවුම් හළ අසළ ඉදිකිරීමට ඇස්තමේන්තු සකසන ලද කඩ කාමර 03 වෙනුවට කඩ කාමර 02ක් සඳහා නැවත ඇස්තමේන්තු සැකසීමත් එන්.ඒ.ස්වර්ණා මියගේ කඩ කාමරය සඳහා වෙනම ඇස්තමේන්තුවක් සැකසීමටත් සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරඹගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කිරම බස් නැවතුම් පොළට යාබදව වරාපිටිය පාර අසළ අළුතින් කඩ කාමර 02ක් ඉදිකිරීමටත් , ඉන්ධන පිරවුම් හළ අසළ ඉදිකිරීමට ඇස්තමේන්තු සකසන ලද කඩ කාමර 03 වෙනුවට කඩ කාමර 02ක් සඳහා නැවත ඇස්තමේන්තු සැකසීමටත් එන්.ඒ.ස්වර්ණා මියගේ කඩ කාමරය සඳහා වෙනම ඇස්තමේන්තුවක් සැකසීමටත් සම්බන්ධව විවෘතිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## __08-13.කිරම බස් නැවතුම් පොළ බිම් මහලෙහි කඩ කාමර සම්බන්ධවයි__

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

කිරම බස් නැවතුම් පොළ බිම මහලෙහි කඩ කාමර සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 34 හා හා 2022.07.29 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපිය අනුව කිරම බස් නැවතුම් පොළ බිම් මහලෙහි ඉදිකර ඇති කඩ කාමර සඳහා 2022.03.02 දිනැතිව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් තක්සේරු වාර්තාවට අනුව අදාළ බදු කරුවන් සමග ඉදිරිපත් කර ඇති ගිවිසුමට අනුව ගිවිසුම් ගත විම සුදුසු බව 2022.03.24 මහ සභාවෙහි තීරණය වි ඇත. නමුත් ද.ප.සං /ප.පා.කො/2010/01 චක්‍රලේඛ ප්‍රකාරව තක්සේරු බදු කුලිය ක්‍රියාත්මක වන දිනය සහා සම්මුතියක් මගින් තහවුරු කළ යුතු බැවින් එම බදු කරුවන් 06 දෙනා සමග 2022.04.01 දින සිට පෙරදාතම් කර ගිවිසුම් ගත විම සුදුසු බවත් හිග බදු කුලී සහ එක්වන් මුදල් අය කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී අයි.කේ.සුසන්ත පද්ම කිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

අපි මේ බදු කරුවන් සමග ලබා දී ඇති ගිවිසුම අනුව ගිවිසුම් ගත වෙමු.

ඒ අනුව කිරම බස් නැවතුම්පොළ බිම් මහලෙහි කඩ කාමර ලබා දී ඇති බදු කරුවන් 06 දෙනා සමග 2022.04.01 දින සිට පෙරදාතම් කර ගිවිසුම් ගත විම සම්බන්ධවත් හිග බදු කුලී සහ එක්වන් මුදල් අය

කිරීම සම්බන්ධවත් විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-14. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-15. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ඩබ්.ඒ.සංජීව මැතිතුමා</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-16. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම රමණි හල්පෙගමගේ මැතිතුමිය</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. රමණි හල්පෙ ගමගේ මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-17. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-18. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම යූ.ජී.ධර්මසිරි මැතිතුමා</u>**
**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ජේ.ජ්. ගාමිණී මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-19. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම එච්.කේ.ජ්. ආනන්ද කුලසුන්දර මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. එච්.කේ.ජ්. ආනන්ද කුලසුන්දර මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-20. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම කේ.රන්ජන් වීරසේකර මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-21. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ටී.බී. ඉන්දික මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ටී.බී.ඉන්දික මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**09.ප්‍රගතිය සාකච්ඡා කිරීම**
**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, ගිය සභා වාරයේ ඉන්ධන ලබා දීම සම්බන්ධව මම කථා කළේ බිල් බෙදන අය පිළිබඳව නොවෙයි ජල මෝටර් ක්‍රියාකරවන අය පිළිබඳව . එය වෙනස් විය යුතුයි . ඒත් එක්කම ගිය සභාවෙත් මම මතක් කළා අක්‍රිය විදි ලාම්පු ටික නැවත සක්‍රිය කරලා දෙන්න කියලා. ඒ කටයුත්ත ඉක්මණින් ආරම්භ කරන්න කියලා ඉල්ලීම් කරනවා.

අනෙක් කාරණය විදියට ඉන්ධන තොගයක් තබාගැනීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් හෝ ඩිපෝව සමග සාකච්ඡා කරලා අවශ්‍ය ඉන්ධන ලබා ගන්න. ඒක ලොකු ඉතිරියක් . ඒ සඳහා වෙනම ටැංකියක් ස්ථාපිත කරන්න ඕන. ඒක ලොකු ලාභයක් වෙනවා. අපේ වාහන සඳහාත් ඒක විශාල ප්‍රයෝජනයක් වෙනවා. මාතර නගර සභාවේ ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනාව තියෙනවා. ඒ අය ඒ ව්‍යාපෘතිය කරනවා. එම ස්ථානයෙන් තොරතුරු ලබා ගන්න පුළුවන්.

ඒත් එක්කම මේ දිනවල වතුර බවුසර් වලින් වතුර බෙදද්දි බොහෝ නිවෙස් වල වතුර ටැංකි නිවස පිටුපස තමයි පිහිටලා තියෙන්නේ. නමුත් නිවස ඉදිරියේ ට්‍රැක්ටර් නවත්තලා වතුර ගහන්න

අමාරු නිසා මේ වාහන වලට හෝස් අඩි 20ක් හෝ ලබා දෙනවා නම් හොඳයි. අපිට මේ කටයුතු සඳහා PTO බවුසරයක් කියනවා නම් හොඳයි.

ඒත් එක්කම පසුගිය සභා වාරයක අපි යන්ත්‍රෝපකරණ ව්‍යාපාතිය මගින් සභාවට අය විය යුතු හිග මුදල් සම්බන්ධව කථා කළා. එහි වාර්තාවට අනුව අපි පෞද්ගලිකව දන්න අය ඉන්නවා. ඒ නිසා සභාවට පාඩුවක් නොවෙන්න කඩිනමින් ඒ සඳහා අය කිරීම් කරන්න කියලා මම ඉල්ලීම කරනවා.

අනෙක් කාරණය විදියට සභාපතිතුමණි, මේ දිනවල ලිපි ලේඛන වල මිල අධික වීමත් සමග අපිට මේ සභා වාර්තා සියලුම ඡායා පිටපත් සමග ලබා දෙන්න A4 කොළ සැකට් 6-7ක් පමණ අවශ්‍ය වෙනවා. මෙ සියල්ල අපිට ඡායා පිටපත් කර නොදී අත්‍යාවශ්‍ය ලේඛනයක් පමණක් දෙන්න කියලා යෝජනා කරනවා. න්‍යාය පත්‍ර යේ ඇතුළත් වන ඇතැම් යෝජනා ඔබතුමා කියවීම පමණක් ප්‍රමාණවත් කියලා හිතෙනවා. ඒ සියල්ල න්‍යාය පත්‍රයේ ඇතුළත් වන නිසා. දැනට බොහෝ ආයතන මේ ඊ-මුක් ඔස්සේ ලිපි ගනුදෙනු කරන කාලයක අපිත් එවැනි ක්‍රම වේද අනුගමනය කර යම ඉහිරියක් කරනවා නම් හොඳයි.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ඒ. ගාමිණී මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අපට අයිති කොම්පෝස්ට් අංගනයෙහි පිටස්තර පුද්ගලයින් ඇතුළු වෙනවා මම දැකලා තියෙනවා. මෙ පිළිබඳ අවධානයෙන් සිටින්නත් අදාළ අයව ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන්නත් කියලා ඉල්ලුම් කරනවා.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය නගරය තුළ ඩෙංගු රෝගීන් වැඩි වීමේ ප්‍රවණතාවයක් තියෙනවා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි හෙට දිනයේ ඩෙංගු වැඩසටහනක් සංවිධානය කරලා තියෙනවා.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

එම වැඩසටහන වඩාත් ක්‍රමවත්ව , සංවිධානාත්මකව කරන්න කියලා ඉල්ලීමක් කරනවා. පිටින් හරි මැෂින් කුලියට ලබා ගෙන මිද්දෙනිය නගරයේ කාණු පද්ධතිය ශුද්ධ කරනවා නම් හොඳයි. ඒත් එක්කම කුමා ස්ටිකර් ආයතනය සමග පසුගිය දිනක සාකච්ඡාවක් සංවිධානය කරල තිබුණත් එය තෙල් ප්‍රශ්නය නිසා පවත්වන්න නොහැකි වුණා. ඒ සඳහා නැවත දිනයක් ලබා ගෙන එය සිදු කරමු.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට කුලියට මැෂින් ගන්න බැහැ. ඒ සඳහා පවතින තත්වය මත ගෙවීම කරන්නත් බැහැ. ඒ නිසා අපේ මැෂින් ටික අලුත් කරන්න පුළුවන් දෙයක් කරමු. කුමා ස්ටිකර් ආයතනය සමග සාකච්ඡාවක් ඉක්මණින් කැඳවමු.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අපි කිරම කඩ කාමර ලබා දීම පිළිබඳ කථා කළා. ඒ සම්බන්ධව තීරණයක් ගත්තද? දැනට එහි තත්වය කුමක්ද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

කිරම කඩ කාමර ලබා දීම සම්බන්ධව අපි සාකච්ඡාවක් පැවැත්වුවා. එහිදී ස්වර්ණා මහත්මියට වීරාපිටිය පාරට හැරෙන ස්ථානයේ කඩ කාමරයක් සකස් කර ගන්න තීරණය වුවත් පසුව පිරවුම් හළ අසළ සකස් කරන කඩ කාමර තුනෙන් එකක් දෙන්න තීරණය කළා. එය එම පාර්ශවය විසින්ම සකස්

කර ගන්න කැමති වුණා. අනෙක් අයත් එහෙම සකස් කර ගන්නවා නම් ඒක වාසිදායකයි. අපි දැනට මේ කඩ කාමර සකස් කර ගන්න ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යවලා තියෙනවා. එහෙම අනුමැතිය නොලැබුණොත් අපි ඒ අයගෙ මුදලින් හදා ගන්න කියමු.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.ජී.එස්. වීරසිරි මැතිතුමිය</u>

ගරු සභාපතිතුමණි, මගේ කොට්ඨාශයේ විදි ලාම්පු කිහිපයක් අක්‍රිය වෙලා. ඒ ටික සකස් කරන්න අවශ්‍යයි. රාත්‍රියට ඇගලුම් සේවාවන් සඳහා යන අයට බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්න වෙනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒ ටික සකස් කර ගන්න වැඩ කරන අය එවන්නම්. ඒ අය එනවිට ඔබතුමියව දැනුවත් කරන්නම්.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී මාලනී දිසානායක මැතිතුමිය</u>

ගරු සභාපතිතුමණි, අපේ සභාවේ ආදායම් අඩු වෙලා තියෙන වෙලාවක ඒ සඳහා ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස හෙළ බොජුන් හලක් ස්ථාපිත කිරීම මගින් ආදායම උපයා ගන්න පුළුවන්. එවැනි ව්‍යාපෘතියක් කරන්න තියෙනවා නම් හොඳයි කියලා යෝජනා කරනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒක හොඳ යෝජනාවක්. අපි තාක්ෂණ නිලධාරීන් යොදවලා ඒ සම්බන්ධව අවශ්‍ය ව්‍යාපෘතියක් සකස් කරන්න කියමු.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, අපිට ලබා දෙන සභා වාර්තා සඳහා යන පිරිවැය ඉතා ඉහළ මට්ටමක නිසා මේ සඳහා අපේ සභාවේ මන්ත්‍රීවරුන් එකතු කර වට්ස්ඇප් ගෘප් එකක් සකස් කරන්න පුළුවන් . එමගින් ඒ සඳහා යන පිරිවැය බොහෝ දුරට අඩු කර ගන්න පුළුවන්. අපිට අදාල ලිපි එම වට්ස් ඇප් ගෘප් එකට එවන්න පුළුවන්. ඊත් එක්කම සභාපතිතුමණි, අපේ මහ සභා රැස්වීමක් මහජනතාවට නරඹන්න අවශ්‍ය නම් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න ඕන නේද? පාර්ලිමේන්තුවෙන් එම අවස්ථාව ලබා දෙන බැවින් අපිත් යම් කෙනෙක් ඉල්ලුවොත් ඒ අවස්ථාව දෙමු. නමුත් මේ ස්ථානයේ ඉඩකඩ ප්‍රමාණවත් නැහැ නේද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

යම් කෙනෙක් සභා රැස්වීමක් නැරඹීමට අවස්ථාව ඉල්ලුවොත් මෙතන සීමිත පිරිසකට ඉඩකඩ හදලා දෙන්න පුළුවන්.ඒක ගැටළුවක් නැහැ.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.එල්. ජයන්ත මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ ප්‍රදේශයේ ජනතාවට බීමට ලබා දෙන ජලය පිළිබඳව අපිට සෑහීමකට පත් වෙන්න බැහැ. මම හම්බෙගමුව ප්‍රදේශයේ පන්සලක ජනතාවට පිල්ටර් ක්‍රමය ඔස්සේ බීමට ජලය ලබා දෙන ව්‍යාපෘතියක් අධ්‍යයනය කළා. එය හමුදා නිලධාරීන් තමයි නඩත්තු කරන්නේ. එවැනි ක්‍රමයක් ඔස්සේ හරි මේ ජනතාවට පිරිසිදු ජලය ටිකක් දෙන්න පුළුවන්. අපිට බිබුල ලිංදෙහි ජලය පිල්ටර් කරන්න ක්‍රමයක් හදා ගන්න බැරිද? මේ ජල ප්‍රශ්නය සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් හරි කථා කරලා යම් දෙයක් කරන්න බැරිද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි දැනට අඹවත්ත පවිත්‍රාගාරයෙන් පමණයි ජලය පිල්ටර් කරන්නේ. නමුත් සියලුම ජල බලාගාර වල ජලය බෙදාහැරීමේදී ඒකාබද්ධ වන නිසා ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. මේ සම්බන්ධව අපි යම් යම් අංශ සමග දිගින් දිගටම කථා කළා. බිබුල ජල බලාගාරයෙන් ජලය පිල්ටර්

කිරීමේදී ලොකු පිරිවැයක් දරන්න වෙනවා. එහිදී ජලය ටැංකියේ උස මට්ටම හේතුවෙන් දෙවරක් පම්ප් කරන්න අවශ්‍යය වෙනවා. කෙසේ නමුත් මේ යෝජනාව ටිකක් පස්සට යන්න හේතුව වුණේ අගුණුකොල වතුර ව්‍යාපෘතිය මෙහෙට එන බව දැන ගැනීමත් එක්ක.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

සභාපතිතුමණි, මේ වතුර පිල්ටර් ක්‍රමය ගැන කථා කරද්දී මම ගලේවෙල ප්‍රදේශයේ ප්‍රදේශ කිහිපයක් සඳහා වතුර පිල්ටර් කරලා බීමට ලබා දෙන ආකාරය දැක්කා. බීමට අවශ්‍ය සියලු දෙනා එතනට පැමිණ වතුර ගන්න පුළුවන්. ඒකත් හමුදා නිලධාරීන් තමයි පාලනය කරන්නේ. අපිට එවැනි දෙයක් කරන්න පුළුවන්. අපිට ඔනෑ කෙනෙකුට බොන්න දෙන්න එවැනි ආකාරයේ ව්‍යාපෘතියක් සකස් කරලා අපේ සේවකයින් දාලා ඒ කාර්යය කරමු. නොමිලේ වතුර සැපයුම කරන්න බැරි නම් අපි අඩු මුදලකට හරි දෙමු.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපිට එවැනි ව්‍යාපෘතියක් බලලා ඇවිත් කරන්න පුළුවන්. ඒ ගැන ඉදිරියේදී සළකා බලමු.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, කටුවන රත්මසාර බෝක්කුව ළඟ කාණු පාදලා දෙන්න. ඉදිරියේදී වැස්ස නිසා බොහෝ ගැටළු වලට මුහුණ දෙන්න වේවි. ඒත් එක්කම විදි ලාම්පු කිහිපයක් සකස් කර ගන්න තියෙනවා. අපි මීට පෙර සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ එක්ව කළා. එවැනි වැඩසටහන් පිළිබඳ සොයා බලලා කරනවා නම් හොඳයි. මාර්ග වල සුනඛයින් පිරිස වැඩි වෙලා වගේම ජලභීතිකාව වැනි රෝග සඳහා ඖෂධ නොමැති ප්‍රශ්නයකුත් තියෙනවා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ඒ. ගාමිණී මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය මහා විද්‍යාලයේ ජලය පිල්ටර් කර ගෙන ළමයින්ට ලබා ගන්න ක්‍රමවේදයක් තියෙනවා. අපිටත් එවැනි ක්‍රමයක් භාවිතා කරන්න පුළුවන්. අනෙක් කාරණය විදියට මිද්දෙනිය මාළු වෙළඳපොළේ කරාඩි ටින පරීක්ෂා කර ගන්න අවශ්‍යයි. ඒවායේ යම් යම් අක්‍රමිකතා ඇති බව තමයි කියන්නේ. ඒ සම්බන්ධව පරීක්ෂා කරනවා නම් හොඳයි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒ සම්බන්ධව අපිට යමක් කරන්න බැහැ. කිරුම් මිනුම් සම්බන්ධ පරීක්ෂා කටයුතු කරන අය වෙත දන්වමු.

## <u>10. - ස්තූතිය හා නිමාව.</u>

අද දින 2022 වර්ෂයේ අගෝස්තු මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වූ අපේ හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිලධාරීතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලද අතර සභාවේ වැඩ කටයුතු නිම කරන ලදී.

ප.ව 01.30 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

..........................
අයි.ජී.මහින්ද
සභාපති
කටුවන ප්‍රාදේශීය සභාව

අයි. ජී. මහින්ද
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව,
මිද්දෙනිය.